සමිති රෙජිස්ට්‍රාර්.

2018 පෙබරවාරි මස 03 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03 - 22

---

එස් 5662.

**සමිති ආඥාපනත (123 අධිකාරිය)**

6 (1) වගන්තිය යටතේ "සීමාසහිත දොඹගොඩ සර්වෝදය ශ්‍රමදාන සමිතිය"හි නම කපා හැරීමේ දැන්වීම

සමිති ආඥාපනත (123 අධිකාරය) විධිවිධාන යටතේ 1997.06.03 වැනි දින ලියාපදිංචි සමිතියක් වන "සීමාසහිත දොඹගොඩ සර්වෝදය ශ්‍රමදාන සමිතිය" ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතු පැවැති හෙයින්, 2017.10.30 වැනි දින "සීමාසහිත දොඹගොඩ සර්වෝදය ශ්‍රමදාන සමිතිය" නම මෙම කාර්යාලයේ තිබෙන සමිති රෙජිස්ටරයෙන් කපා හැරි බවත්, සමිතිය විසුරුවා හැරි බවත්, සමිති රෙජිස්ට්‍රාර් දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම සමිති ආඥාපනතේ 6 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමිති රෙජිස්ට්‍රාර්.

2018 පෙබරවාරි මස 03 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03 - 23

---

එස් 11171.

**සමිති ආඥාපනත (123 අධිකාරය)**

6 (1) වගන්තිය යටතේ "ශ්‍රී ශෛලාරාම විහාරස්ථාන කාර්ය සාධක සමිතිය"හි නම කපා හැරීමේ දැන්වීම

සමිති ආඥාපනත (123 අධිකාරය) විධිවිධාන යටතේ 2011.11.29 වැනි දින ලියාපදිංචි සමිතියක් වන "ශ්‍රී ශෛලාරාම විහාරස්ථාන කාර්ය සාධක සමිතිය" ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතු පැවැති හෙයින්, 2017.10.30 වැනි දින "ශ්‍රී ශෛලාරාම විහාරස්ථාන කාර්ය සාධක සමිතිය" නම මෙම කාර්යාලයේ තිබෙන සමිති රෙජිස්ටරයෙන් කපා හැරි බවත්, සමිතිය විසුරුවා හැරි බවත්, සමිති රෙජිස්ට්‍රාර් දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම සමිති ආඥාපනතේ 6 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමිති රෙජිස්ට්‍රාර්.

2018 පෙබරවාරි මස 03 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03 - 24

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 40 වෙනි වගන්තිය මගින් බලාත්මක කරන ලද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 04 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය.

ටී. ඩී. කරුණාරත්න පෙරේරා/ ටී. ලසිත ලක්මාල් පෙරේරා.
ඉතිරි කිරීම් ගිණුම් අංක 708010103181.
ණය ගිණුම් අංක 708059600510.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017 ජුලි මස 25 වැනි දින පැවැත්වීමට යෙදුනු 2017/09 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් අයුරින් විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙනුවෙන් අංක 68 නීතිඥ සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල, නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. හේවාපතිරණ මහතා විසින් සහතික කරන ලද 2014.12.08 හා අංක 9668 දරන උකස් ඔප්පුව ප්‍රකාර අයවිය යුතු මුදල් ගෙවීම ණයකරුවන් ලෙස හඳුන්වනු ලබන දොඩම්ගස්ලන්ද, ලිහිණිවැහැර, රත්විට පාර, "සිරිලක් කොහුමෝල" හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 562711678V හිමි තලගලගේ ධර්මසිරි කරුණාරත්න පෙරේරා, එම ලිපිනයේම පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 911173255V හිමි තලගලගේ ලසිත ලක්මාල් පෙරේරා යන අයවලුන් ණය ගෙවීම පැහැර හැර ඇත. එබැවින් එකී උකස්කරය යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට අයවිය යුතු රුපියල් හතලිස් හය ලක්ෂ හය දහස් නවසිය අනූ හතක (රු. 4,606,997.00) මුදල 2017.05.22 වැනි දින සිට වෙන්දේසි දින දක්වා වාර්ෂිකව 14% ක පොලී අනුපාතය යටතේ අයවිය යුතු පොලිය ද, බඳු ද දැන්වීම් ගාස්තු ද ඇතුළු වෙන්දේසි වියදම් ද සමග තවදුරටත් නීත්‍යානුකූල වියදමක් බැංකුවට අයවීමට තිබේනම් එම මුදල් ද අයකර ගැනීම සඳහා ණයකරුවන් විසින් අංක 9668 උකස් ඔප්පුව මගින් උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු ය. එම දේපළෙහි විස්තර පහත උපලේඛනයෙහි දැක්වේ.

තවද එකී උපලේඛනය මගින් විස්තර කර ඇති දේපළ වෙන්දේසි කිරීමේ බලය අංක 24, ටොරින්ටන් පාර, මහනුවර පිහිටි බලයලත් වෙන්දේසිකරු ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම වෙත පවරා ඇත.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල හත්පත්තුවේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිදීගම ප්‍රාදේශීය සභා සීමාවේ ඉහල විසිදෙකේ නැගෙනහිර කෝරළේ අංක 553 ලිහිණිවැහැර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ලිහිණිවැහැර ගමේ පිහිටි "කටුපලාහේන" (ටී.පී. 426250)" නැමති ඉඩමට බලයලත් මානක නිලධාරී ඩබ්. ඒ. ගුණතිලක මහතා මැන සාදන ලද අංක 5226 සහ 2009.11.17 වැනි දින දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කල කැබලි අංක 05 දරන, උතුරට : කුඩා ඔය ද, නැගෙනහිරට : අංක 1922 දරන පිඹුරේ අංක 02 දරන කොටස සහ අංක 03 සහ අංක 04 දරන කොටස් ද, දකුණට : හැන්ඩි ප්‍රනාන්දුට අයිති ඉඩම ද, බස්නාහිරට : හැන්ඩි ප්‍රනාන්දුට අයිති ඉඩම ද, යන මායිම් තුළ වූ අක්කර එකයි රූඩ් එකයි පර්චස් විසිඑකයි දශම අටක් (අ. 01, රූ. 01, පර්. 21.8) විශාල ඉඩම හා ඊට අයත් ගස්කොළ, පලතුරු යානදී සියළු දේත් සමග ඉහත කී පිඹුරේ කැබලි අංක 02 සහ 03 දරන පාරවල් භාවිතා කිරීමේ සහ නඩත්තු කිරීමේ අයිතියද වේ. (මෙම ඉඩමේ L 25/63 යටතේ ලියාපදිංචි කර ඇත.)

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල හත්පත්තුවේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිදීගම ප්‍රාදේශීය සභා සීමාවේ ඉහල විසිදෙකේ නැගෙනහිර කෝරළේ අංක 553 ලිහිණිවැහැර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ලිහිණිවැහැර ගමේ පිහිටි "කටුපලාහේන" (ටී.පී. 426250)" නැමති ඉඩමට බලයලත් මානක නිලධාරී ඩබ්. ඒ. ගුණතිලක මහතා මැන සාදන ලද අංක 5996 කියා ඇතත් නිවැරදි ලෙස අංක 5966 සහ 2013.01.02 වැනි දින දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන්කල කැබලි අංක 01 දරන, උතුරට : කුඩා ඔය ද, නැගෙනහිරට : අංක 5352 දරන පිඹුරේ කැබලි අංක 01 හි ඉතිරි කොටස ද, දකුණට : අංක 5226 දරන පිඹුරේ අංක 03 ද, බස්නාහිරට : අංක 5226 දරන පිඹුරේ කැබලි අංක 05 ද යන මායිම් තුල වූ රූඩ් දෙකක් (අ. 0, රූ. 02, පර්. 0) විශාල ඉඩම හා ඊට අයත් ගස්කොළ, පලතුරු යානදී සියලු දේත් සමග අංක 5226 දරන පිඹුරේ කැබලි අංක 03 දරන ප්‍රවේශ මාර්ග අයිතියද වේ. (මෙම ඉඩමේ L 25/84 යටතේ ලියාපදිංචි කර ඇත.)

3. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාවතගම ප්‍රාදේශීය සභා සීමාවේ මහගල්බඩ මොගොඩ කෝරළේ අංක 709 කහඳ වැලිපොත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උයන්දන ගමේ පිහිටි "රෙනිල් වත්ත" නැමති ඉඩමට බලයලත් මානක නිලධාරී එච්. විජයතුංග මහතා මැන සාදන ලද අංක 96138 සහ 1996.09.02 දින දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 01 දරන ,උතුරට : අංක 72 දරන පිඹුරේ ලොට් අංක 06 සහ ගල්පොත්ත වත්ත ද, නැගෙනහිරට : ඉඩම් වලට යන අඩි 15 ක් පළල ප්‍රවේශ මාර්ගය ද, දකුණට : මහා මාර්ගයේ සිට ඇති ප්‍රවේශ මාර්ගය ද, බස්නාහිරට : මහා මාර්ගයේ සිට ඇති ප්‍රවේශ මාර්ගය ද, යන මායිම් තුළ වූ රූඩ් එකක් (අ. 00, රූ. 01, පර්. 0) ක් විශාල ඉඩම හා ඊට අයත් සියළු දේත්,

නැවත මැන ඉහත කී බලයලත් මිනින්දෝරු එච්. විජයතුංග මහතා විසින් සාදන ලද අංක 5418 සහ 2012.06.07 දින දරන පිඹුරේ සඳහන් ප්‍රකාර කැබලි අංක 01 ඉඩමට එකී පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : ඒ. ඩී. එෆ්. කීර්තිසේනට අයිති ඉඩම බලයලත් මිනින්දෝරු කේ. එම්. එච්. නවරත්න මහතාගේ පිඹුරු අංක 72 හි කැබලි අංක 06 සහ අනුෂා සුහසිංහට අයිති ඉඩම ද, නැගෙනහිරට: ඉඩම් වලට යන අඩි 15 ක් පළල පාර ද, දකුණට : මහා මාර්ගයේ සිට ඉඩම්වලට යන ගම්සභා මාර්ගය සහ ඉඩම් වලට යන අඩි 15 ක් පළල පාර ද, බස්නාහිරට : මහා මාර්ගයේ සිට ඉඩම්වලට යන ගම්සභා මාර්ගය ද, යන මායිම් තුල වූ රූඩ් එක (අක්.00, රූඩ්.01,

පර්.00) ක් විශාල ඉඩම හා ඊට අයත් ගහකොළ, පලතුරු යනාදී සියළු දේත් වේ. (මෙම ඉඩම H 17/91 යටතේ ලියාපදිංචි කර ඇත.) යන මායිම් තුළ වූ ඉඩම සහ ඒ තුළ වූ ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලුදේත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 933 නුවර පාර,
වෙදමුල්ල,
කැළණිය.

03 - 30

---

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 40 වෙනි වගන්තිය මගින් බලාත්මක කරන ලද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 04 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය.

අංගොඩ කංකානම්ලාගේ ආරියරත්න.
ඉතිරි කිරීම් ගිණුම් අංක : 818010101691.
ණය ගිණුම් අංක : 818059700002/818059700097.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2017 නොවැම්බර් මස 28 වැනි දින පැවැත්වීමට යෙදුණු 2017/13 දරන අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් අයුරින් විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙනුවෙන් පොළොන්නරුව නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් තිලක බණ්ඩාර උඩගෙදර මහතා විසින් සහතික කරන ලද 2013.05.20 වැනි දින හා අංක 701 දරන උකස් ඔප්පුව හා 2015.03.19 වැනි දින හා අංක 873 දරන උකස් ඔප්පු ප්‍රකාරව අයවිය යුතු මුදල් ගෙවීම අංක 426, දියසෙන්පුර, කහඹිලියාව, පොළොන්නරුව යන ලිපිනයේ පදිංචි ණයකරු ලෙස හඳුන්වනු ලබන, අංගොඩ කංකානම්ලාගේ ආරියරත්න යන අය ණය ගෙවීම පැහැරහැර ඇති බැවින් එකී උකස්කරය යටතේ 2017.11.22 වැනි දිනට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට අයවිය යුතු රුපියල් පනස් එක් ලක්ෂ තිස් අට දහස් හයසිය අනූ හයයි ශත හතලිස් එකක (රු. 5,138,696.41) ණය මුදල, එදිනට අයවිය යුතු පොලිය රුපියල් දහනව ලක්ෂ හයදහස් අටසිය තිස් දෙකයි ශත පනස් හතක (රු. 1,906,832.57) මුදල හා එදිනට අයවිය යුතු ගාස්තු රුපියල් එක් ලක්ෂ හැට දහස් හයසිය හැට හතරයි ශත පනහක (රු. 160,664.50) මුදල හා 2017.11.22 වැනි දින සිට වෙන්දේසි දින දක්වා වාර්ෂිකව 818059700002 දරන ණය මුදල සඳහා 24% ක් ද, 818059700097 දරන ණය මුදල සඳහා 17% ක පොලී අනුපාතික යටතේ අයවිය යුතු පොලියද වැට් බදු හා දැන්වීම් ගාස්තුද ඇතුළු වෙන්දේසි වියදම්ද සමග තවදුරටත් නීත්‍යානුකූල වියදමක් බැංකුවට අයවීමට තිබේ නම් එම මුදල්ද අයකර ගැනීම සඳහා ණයකරුවන් විසින් අංක 701 හා 873 දරන උකස්කර මගින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට උකස් කර ඇති මෙහි පහත උපලේඛණයෙහි විස්තර කරන දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු ය. එම දේපලෙහි විස්තර පහත උපලේඛනයෙහි දැක්වේ.තවද එකී උපලේඛනය මගින් විස්තර කර ඇති දේපල වෙන්දේසි කිරීමේ බලය අංක 24, ටොරින්ටන් පාර, මහනුවර පිහිටි ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම වෙත පවරා ඇත.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ආදායම් නිළධාරී කොට්ඨාශයේ, සිංහල පත්තුවේ, මැදිරිගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශයේ, අංක 68/බී, මැදිරිගිරිය ග්‍රාම නිළධාරි කොට්ඨාශයේ, කවුඩුලුවැව 1 වන පියවර නැමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති අංක අ.ජ.පි.පො. 107 දරන පිඹුරෙහි අංක 274 දරන බිම්කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් තුන (අ. 02, රූ. 02, පර්. 03) විශාලත්වය ඇතැයි ගණන්බලා තිබෙන කහඹිලියාව යාය යනුවෙන් හඳුන්වනු ලබන උතුරට 204, නැගෙනහිරට 286, දකුණට 285, බස්නාහිරට 275, යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩමෙන් මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම්තුමියගේ අංක NCP/MG/L/1 මිනුම් පොදු හා 2007.07.16 දරන ලිපියේ ස්වරූපයෙන් ලැබු අවසරය මත, රඹුක්කන පදිංචි බලයලත් මානක එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මහතා විසින් මැන සාදන ලද අංක 4721 හා 2007.07.20 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 වශයෙන් දක්වා ඇති බෙදාවෙන් කරන ලද විශාලත්වයෙන් අක්කර 01 රූඩ් නැත පර්චස් විසිපහයි දශම එකයි නමයක් (අ. 01, රූ. 0, පර්. 25.19) යුතු වූ බිම් කැබැල්ල සඳහා සීමාවන්, උතුරට : අ.ජ.පි.පො. 107 පිඹුරේ 204 දියසෙන්පුර කහඹිලියාව පාර, නැගෙනහිරට : අ.ජ.පි.පො. 107 පිඹුරේ 286 මැදිරිගිරිය කහඹිලියාව පාර, දකුණට : අ.ජ.පි.පො. 107 පිඹුරේ 285, බස්නාහිරට : මෙම ඉඩමේ කොටසක් යන මායිම් තුළ පිහිටි ඉඩම හා ඊට අයිති ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සෑම සියළු දේද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 933 නුවර පාර,
වෙදමුල්ල,
කැළණිය.

03 - 31

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4වැනි වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2018 ජනවාරි මස 29 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් සංජීව පී. ෆොන්සේකා විසින් ලියා සහතික කරන ලද 2015.09.14 දිනැති අංක 2432 දරන උකස් බැඳුම්කරය, 2016.02.19 දිනැති අංක 2520 දරන උකස් බැඳුම්කරය සහ 2016.11.29 දිනැති අංක 2646 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, බදුල්ලේ ක්‍රිෂ්ණසාමි කිරුෂාන්ත් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2017 නොවැම්බර් මස 30 වැනි දිනට එකී ක්‍රිෂ්ණසාමි කිරුෂාන්ත් යන අයගෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 2432, 2520 හා 2646 දරන උකස් බැඳුම්කරය මත රුපියල් හතලිස් තුන් ලක්ෂ දහනව දහස් නවසිය හැත්තෑ හයයි ශත අනූ එකක (රු. 4,319,976.91) මුදලක් ද, 2017 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් තිස් තුන් ලක්‍ෂ හැත්තෑ එක් දහස් තුන්සිය තිහයි ශත හතක (රු. 3,371,330.07) මුදල මත සෑම වර්ෂයකම තුන් මසකට වරක් එනම් ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩකරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) (ස්ථානීය) ඉහළින් වාර්ෂිකව සියයට හතයි දශම පහක් (7.5%) වූ අනුපාතිකය (වාර්ෂිකව සියයට දහ හතරයි දශම පහක් (14.5%)) වූ අවම අනුපාතිකයට යටත්ව) මත ගණනය කරනු ලබන වැඩිදුර පොලිය ද, රුපියල් හත් ලක්‍ෂ හැට හතර දහස් හාරසිය දහනවයයි ශත විසි තුනක (රු. 764,419.23) ක මුදල මත සෑම වර්ෂයකම තුන් මසකට වරක් එනම් ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩකරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) (ස්ථානීය) ඉහළින් වාර්ෂිකව සියයට අටක් (8%)වූ අනුපාතිකය (වාර්ෂිකව සියයට පහළොවයි දශම පහක් (15.5%) වූ අවම අනුපාතිකයට යටත්ය) මත ගණනය කරනු ලබන වැඩිදුර පොලිය ද සහ රුපියල් තිස් දෙලක්‍ෂ පනස් හය දහස් අටසිය හැට හතරයි ශත තුනක (රු. 3,256,864.03)ක මුදල මත වාර්ෂිකව සියයට විසි අටක් (28%) බැගින් වූ අනුපාතිකය මත ගණනය කරනු ලබන වැඩිදුර පොලිය ද අයවිය යුතුව සහ ගෙවිය යුතුව ඇති බැවින් ද,

තවද, එකී මුදල වන රුපියල් හතලිස් තුන් ලක්‍ෂ දහනව දහස් නවසිය හැත්තෑ හයයි ශත අනූ එකක (රු. 4,319,976.91) මුදලක් ද, 2017 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් තිස් තුන් ලක්‍ෂ හැත්තෑ එක් දහස් තුන්සිය තිහයි ශත හතක (රු. 3,371,330.07) මුදල මත සෑම වර්ෂයකම තුන් මසකට වරක් එනම් ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩකරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) (ස්ථානීය) ඉහළින් වාර්ෂිකව සියයට හතයි දශම පහක් (7.5%) වූ අනුපාතිකය (වාර්ෂිකව සියයට දහ හතරයි දශම පහක් (14.5%) වූ අවම අනුපාතිකයට යටත්ව) මත ගණනය කරනු ලබන වැඩිදුර පොලිය ද, රුපියල් හත් ලක්‍ෂ හැට හතර දහස් හාරසිය දහනවයයි ශත විසි තුනක (රු. 764,419.23) මුදල මත සෑම වර්ෂයකම තුන් මසකට වරක් එනම් ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩකරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWRP) (ස්ථානීය) ඉහළින් වාර්ෂිකව සියයට අටක් (8%)වූ අනුපාතිකය (වාර්ෂිකව සියයට පහළොවයි දශම පහක් (15.5%) වූ අවම අනුපාතිකයට යටත්ව) මත ගණනය කරනු ලබන වැඩිදුර පොලිය ද සහ රුපියල් තිස් දෙලක්‍ෂ පනස් හය දහස් අටසිය හැට හතරයි ශත තුනක (රු. 3,256,864.03)ක මුදල මත වාර්ෂිකව සියයට විසි අටක් (28%) බැගින් වූ අනුපාතිකය මත ගණනය කරනු ලබන වැඩිදුර පොලිය ද හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරි වී ඇති යම් කොටසක් එකී පනතේ විස්තර කර ඇති ඉඩම සහ පරිශ්‍රය, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13වන වගන්තියේ නියමයන් යටතේ ඉහත කී උකස් බැඳුම්කරයන්ගේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැයකර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අයකිරීම් ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී ක්‍රිෂ්ණසාමි කිරුෂාන්ත් යන අය විසින් ඉහත කී අංක 2432, 2520 හා 2646 දරන උකස් බැඳුම්කරයන් මගින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම සහ පරිශ්‍රය එහි පිහිටි සියලු දේද අයි.ඩබ්ලිව්. ජයසූරිය මහනුවර බලයලත් වෙන්දේසිකරු ලවා විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හා අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

#### අංක 2432, 2520 හා 2646 දරන උකස් බැඳුම්කරයන් මගින් උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ, දිඹුල කෝරලේ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, නුවරඑළිය ප්‍රාදේශීය සභා බලසීමාව තුළ හෝල්බෲක් 475 I ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ආගරපතන ගමේ හෝල්බෲක් හි පිහිටි (බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්.එම්. පෙරේරා විසින් මැන සකස් කරන ලද 1954.01.21 දිනැති අංක 79 දරන පිඹුරේ ලොට් 7හි නැවත මැනීමක් සහ උපබෙදීමක් වන) "හොල්බෲක් එස්ටේට්" හි කොටසක් වන බලයලත් මිනින්දෝරු එස්. මතියලගන් විසින් මැන සකස් කරන ලද 2015 මැයි 22 දිනැති අංක SMA/228/2015 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණුකොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ප්‍රධාන පාර ද, නැගෙනහිරට : අංක 79 දරන පිඹුරේ ලොට් 8 ද, දකුණට : අඩි පාර ද සහ බස්නාහිරට : අංක 79 දරන පිඹුරේ ලොට් 7හි ඉතිරි කොටස ද වශයෙන් මායිම් වූ එකී අංක SMA/228/2015 දරන පිඹුරට අනුව

ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම හතයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 15.70) විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද සමග වේ.

ඉහත ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටස පහත දැක්වෙන ඉඩමේ කොටසක් වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිඹුල කෝරලේ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නුවරඑළිය ප්‍රාදේශීය සභා බලසීමාව තුළ හෝල්බෲක් 475 I ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ආගරපතන ගමේ හෝල්බෲක් හි පිහිටි (බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්.එම්. පෙරේරා විසින් මැන සකස් කරන ලද 1954 ජනවාරි මස 24 වඩාත් නිවැරදිව 1954 ජනවාරි මස 21 දිනැති අංක 79 දරන පිඹුරේ ලොට් 7 වශයෙන් ලකුණු කරන "හොල්බෲක් එස්ටේට්" හි කොටසක් වන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ප්‍රධාන පාර ද, නැගෙනහිරට : ලොට් 8 ද, දකුණට : දිඹුල ගමේ කම්ටුව හිමිකම් කියන ඉඩම ද සහ බස්නාහිරට : ලොට් 6 ද වශයෙන් මායිම් වූ එකී අංක 79 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකක් (අ. 0, රූ. 0, පර්. 22) විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද සමග වේ. මෙය නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

ලක්ෂමන් සිල්වා,
ප්‍රධාන විධායක නිළධාරි.

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,
73/5, ගාලු පාර,
කොළඹ 03.

03 - 107

---

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4වැනි වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2018 ජනවාරි මස 29 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එන්. ක්‍රිස්ටිනා නිරූජා විසින් ලියා සහතික කරන ලද 2016.05.31 දිනැති අංක 289 දරන උකස් බැඳුම්කරය, මත අයවිය යුතු ගෙවීම් කිරීම, වෙංකලඩි හි, පොඩියප්පු පුන්නියරාජා සහ පරමලිංගම් චන්ද්‍රකලා යන අය විසින් පැහැර ඇති හෙයින් ද,

2017 සැප්තැම්බර් මස 29 වැනි දිනට එකී පොඩියප්පු පුන්නියරාජා සහ පරමලිංගම් චන්ද්‍රකලා යන අයගෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 289 දරන උකස් බැඳුම්කරය මත රුපියල් පනස් පන් ලක්ෂ අනූ නව දහස් හයසිය අසූ පහක (රු. 55,99,685.00) මුදලක් ද, 2017 සැප්තැම්බර් මස 30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් පනස් තුන් ලක්ෂ විසි හය දහස් තුන්සිය හැත්තෑ තුනක (රු. 53,26,373.00) මුදල මත සෑම මසකම වැඩ කරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික අනුපාතිකය (AWPR) ට ඉහළින් වාර්ෂිකව 0.5% වටයනු ලබන්නා වූ වාර්ෂිකව සියයට අටක් (8%) බැගින් වූ අනුපාතිකය මත ගණනය කරනු ලබන වැඩිදුර පොලිය ද අයවිය යුතුව සහ ගෙවිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන රුපියල් පනස් පන් ලක්ෂ අනූ නව දහස් හයසිය අසූ පහක (රු. 55,99,685.00) මුදලක් ද, 2017 සැප්තැම්බර් මස 30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් පනස් තුන් ලක්ෂ විසි හය දහස් තුන්සිය හැත්තෑ තුනක (රු. 53,26,373.00) මුදල මත සෑම මසකම වැඩ කරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික අනුපාතිකය (AWPR) ට ඉහළින් වාර්ෂිකව 0.5% වටයනු ලබන්නා වූ වාර්ෂිකව සියයට අටක් (8%) බැගින් වූ අනුපතිකය මත ගණනය කරනු ලබන වැඩිදුර පොලිය ද හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරිවී ඇති යම් කොටසක් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තියේ නියමයන් යටතේ ඉහත කී උකස් බැඳුම්කරයේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැයකර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අයකිරීම් ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී පොඩියප්පු පුන්නියරාජා සහ පරමලිංගම් චන්ද්‍රකලා යන අය විසින් ඉහත කී අංක 289 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම සහ ගොඩනැගිලි, ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම කොළඹ බලයලත් වෙන්දේසිකරු ලවා විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

#### අංක 289 දරන උකස් බැඳුම්කරය මගින උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් පත්තු-වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, එරාවූර්පත්තු-වෙංකලඩි ප්‍රාදේශීය සභා බලසීමාව තුළ වෙංකලඩි ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ වෙංකලඩි ගමේ පිහිටි උතුරේ සිට දකුණට අඩි 48ක් සහ නැගෙනහිර සිට බටහිරට අඩි 96ක ප්‍රමාණයෙන් යුත් ඉඩමට බලයලත් මිනින්දෝරු වී. රාජෙන්ද්‍රන් විසින් මෑතකදී මැන සාදන ලද 2009.09.24 දිනැති අංක R/535/2009 දරන පිඹුරේ වඩාත් විස්තර කර බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : කේ. කෝනේස්වරි හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : ප්‍රධාන පාර ද, දකුණට සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම තුනයි තුනක්

(අ. 0, රූ. 0, පර්. 16.33) විශාල ඉඩම සහ එහි අඩංගු වන අනෙකුත් සියලු අයිතිවාසිකම් ද සමග වේ.

මෑතකදී කරන ලද මැනීමකට අනුව එකී ඉඩම පහත පරිදි විස්තර කෙරේ.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් පත්තු-වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එරාවූර්පත්තු-වෙංකලඩි ප්‍රාදේශීය සභා බලසීමාව තුළ වෙංකලඩි ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ වෙංකලඩි ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. කමලනාදන් විසින් මැන සාදන ලද 2015.10.05 දිනැති අංක KK/BT/2015/500 J දරන මැනුම් පිඹුරේ ලොට් 01 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : කේ. කෝනේස්වරි හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : පාර (මාර්ග සංවර්ධන අධිකාරියේ) ද, දකුණට : කේ. තංගම් හිමිකම් කියන ඉඩම ද සහ බස්නාහිරට : කේ. තංගම් හිමිකම් කියන ඉඩම ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම තුනයි හතක් (අ. 0, රූ. 0, පර්. 15.37) හෙවත් හෙක්ටයාර 0.0389ක් විශාල ඉඩම සහ ගොඩනැගිලි ද එහි අඩංගු වන අනෙකුත් සියලු අයිතිවාසිකම් ද සමග වේ.

ලක්ෂමන් සිල්වා,
ප්‍රධාන විධායක නිළධාරී.

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,
73/5, ගාලු පාර,
කොළඹ 03.

03 - 108

---

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4වැනි වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2018 ජනවාරි මස 29 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව**

(ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී හි අනුප්‍රාප්තික) ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ආර්. මනිවන්නන් විසින් ලියා සහතික කරන ලද 2014.12.22 දිනැති අංක 6846 හා ප්‍රසිද්ධ නොතාරිස් ආර්. මනිවන්නන් විසින් ලියා සහතික කරන ලද 2015.09.16 දිනැති අංක 7489 දරන උකස් බැඳුම්කරය, මත අයවිය යුතු ගෙවීම් කිරීම, මාතලේ මන්ත්‍රී කෝරලේ ගෙදර සනත් බණ්ඩාර දසනායක යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2017 ඔක්තෝබර් මස 31 වැනි දිනට එකී මන්ත්‍රී කෝරලේ ගෙදර සනත් බණ්ඩාර දසනායක යන අයගෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 6846 හා 7489 දරන උකස් බැඳුම්කරයන් මත රුපියල් එක් කෝටි තිස් හත් ලක්ෂ තුන් දහස් නවසිය තිහයි ශත දහනවයක (රු. 1,37,03,930.19) මුලක් ද, 2017 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් අනූ තුන් ලක්ෂ හැට හත් දහස් අටසිය හැටයි ශත තිස් හතරක (රු. 93,67,860.34) මුදල මත වාර්ෂිකව සීයයට පහළොවයි දශම පහක් (15.5%) බැගින් වූ අනුපාතිකය මත පොලිය ද සහ රුපියල් තිස් ලක්ෂ අසූ දහසක (රු. 30,80,000.00) මුදල මත සෑම වර්ෂයකම තුන් මසකට වරක් එනම් ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකය (AWPR) (ස්ථානීය) ඉහළින් වාර්ෂිකව සීයයට හතයි දශම පහක් (7.5%) වූ අනුපාතිකය මත ගණනය කරනු ලබන වැඩිදුර පොලියද (වාර්ෂිකව සියයට දහ හතරක (14%) ක අවම අනුපාතිකයට යටත්ව) අයවිය යුතුව සහ ගෙවිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන රුපියල් එක් කෝටි තිස් හත් ලක්ෂ තුන් දහස් නවසිය තිහයි ශත දහ නවයක (රු. 1,37,03,930.19) මුදලක් ද, 2017 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් අනූ තුන් ලක්ෂ හැට හත් දහස් අටසිය හැටයි ශත තිස් හතරක (රු. 93,67,860.34) මුදල මත වාර්ෂිකව සියයට පහළොවයි දශම පහක් (15.5%) බැගින් වූ අනුපාතිකය මත පොලිය ද සහ රුපියල් තිස් ලක්ෂ අසූ දහසක (රු. 30,80,000.00) මුදල මත සෑම වර්ෂයකම තුන් මසකට වරක් එනම් ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) (ස්ථානීය) ඉහළින් වාර්ෂිකව සියයට හතයි දශම පහක් (7.5%) වූ අනුපාතිකය මත ගණනය කරනු ලබන වැඩිදුර පොලියද (වාර්ෂිකව සියයට දහ හතරක (14%) ක අවම අනුපාතිකයට යටත්ව) හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරිවී ඇති යම් කොටසක් එකී පහත විස්තර කර ඇති ඉඩම සහ පරිශ්‍රය එහි පිහිටි සියලු දේද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තියේ නියමයන් යටතේ ඉහත කී උකස් බැඳුම්කරවල ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැයකර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අයකිරීම් ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී මන්ත්‍රී කෝරලේ ගෙදර සනත් බණ්ඩාර දසනායක යන අය විසින් ඉහත කී අංක 6846 හා 7489 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම සහ පරිශ්‍රය එහි පිහිටි සියලු දේද, අයි. ඩබ්ලිව් ජයසූරිය, මහනුවර බලයලත් වෙන්දේසිකරු ලවා විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

### අංක 6846 හා 7489 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ මහනගර සභා බලසීමාව ඇතුළත, හිජගොල්ල මොයිසි ක්‍රසන්ට් පාරේ පිහිටි "කොටුවේ ගෙදර වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. එම්. ජයසේකර විසින් මැන සකස් කරන ලද 1996.12.06 දිනැති අංක 4558 දරන පිඹුරේ ලොට් 03 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මොයිසි ක්‍රසන්ට් පාර ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 4 ද, දකුණට : ආච්චිවෙල ඇළ ද සහ බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 02 ද වශයෙන් මායිම් වූ එකී අංක 4558 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහ හතරක් (අ. 0, රූ. 0, පර්. 14) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ අනෙකුත් සියලු දේ ද සමග වේ. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

මෑතක දී කරන ලද නැවත මැනීමකට අනුව එකී ඉඩම පහත පරිදි විස්තර කෙරේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ මහනගර සභා බලසීමාව ඇතුළත, හිජගොල්ල මොයිසි ක්‍රසන්ට් පාරේ පිහිටි "කොටුවේ ගෙදර වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. ඩයස් විසින් මැන සකස් කරන ලද 2014.12.16 දිනැති අංක 3118 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස මායිම්, උතුරට : මොයිසි ක්‍රසන්ට් පාර ද, නැගෙනහිරට : ඒ. චන්ද්‍රසේකර හිමිකම් කියන, බලයලත් මිනින්දෝරු ජේ. එම්. ජයසේකර විසින් මැන සකස් කරන ලද අංක 4558 පිඹුරේ ලොට් 4 ද, දකුණට : ඇල ද සහ බස්නාහිරට : සී. එම්. වාහිඩ් හිමිකම් කියන, බලයලත් මිනින්දෝරු ජේ. එම්. ජයසේකර විසින් මැන සකස් කරන ලද අංක 4558 පිඹුරේ ලොට් 02 ද වශයෙන් මායිම් වූ එකී අංක 3118 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහ තුනයි දශම හතයි හයක් (අ. 0, රූ. 0, පර්. 13.76) (හෙ. 0.0348)ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ අනෙකුත් සියලු දේ ද සමග.

ලක්ෂමන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරි.

ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී,
73/5, ගාලු පාර,
කොළඹ 03.

03 - 109

---

## ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4වැනි වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2018 ජනවාරි මස 29 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව

ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. හෙන්නායක මැණිකේ විසින් ලියා සහතික කරන ලද 2015.03.04 දිනැති අංක 5493, 2014.11.27 දිනැති අංක 5408 සහ 2016.03.15 දිනැති අංක 5915 දරන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, බදුල්ලේ දිසානායක මුදියන්සේලාගේ පියතිස්ස දිසානායක යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2017 සැප්තැම්බර් මස 29 වැනි දිනට එකී දිසානායක මුදියන්සේලාගේ පියතිස්ස දිසානායක යන අයගෙන් ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී වෙත ඉහත කී අංක 5493, 5408 හා 5915 දරන උකස් බැඳුම්කරයන් මත රුපියල් එක් කෝටි පනස් නව ලක්‍ෂ හත්සිය හතයි ශත අනූවක (රු. 15,900,707.90) මුදලක් ද, 2017 සැප්තැම්බර් මස 30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් එක් කෝටි විසි පන් ලක්ෂ තිස්හය දහස් හාරසිය පනස් හතරක (රු. 12,536,454.00) මුදල මත සෑම මසකට වරක් වැඩකරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකට (AWPR) ඉහළින් වාර්ෂිකව 0.5%ට වටයනු ලබන්නා වූ වාර්ෂිකව සියයට හතක් (7%) වූ අනුපාතිකය මත ගණනය කරනු ලබන වැඩිදුර පොලිය ද සහ රුපියල් දහ අට ලක්‍ෂ හැත්තෑ හතර දහස් නවසිය අනූඑකක (රු. 1,874,991.00) මුදල මත සෑම මසකට වරක් වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) ඉහළින් වාර්ෂිකව 0.5%ට වටයනු ලබන්නා වූ වාර්ෂිකව සියයට හතයි දශම පහක් (7.5%) වූ අනුපාතිකය මත ගණනය කරනු ලබන වැඩිදුර පොලිය ද සහ රුපියල් හත් ලක්‍ෂ පනස් අට දහස් දෙසීය හැට හයයි ශත අසූ හතක (රු. 758,266.87)ක මුදල මත වාර්ෂිකව සියයට විසි අටක් (28%) බැගින් වූ අනුපාතිකය මත පොලිය ද අයවිය යුතුව සහ ගෙවිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන රුපියල් එක් කෝටි පනස් නව ලක්‍ෂ හත්සිය හතයි ශත අනූවක (රු. 15,900,707.90) මුදලක් ද, 2017 සැප්තැම්බර් මස 30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් එක් කෝටි විසි පන් ලක්ෂ තිස්හය දහස් හාරසිය පනස් හතරක (රු.12,536,454.00) මුදල මත සෑම මසකට වරක් වැඩකරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) ඉහළින් වාර්ෂිකව 0.5%ට වටයනු ලබන්නාවූ වාර්ෂිකව සියයට හතක් (7%) වූ අනුපාතිකය මත ගණනය කරනු ලබන වැඩිදුර පොලිය ද සහ රුපියල් දහ අට ලක්‍ෂ හැත්තෑ හතර දහස් නවසිය අනූඑකක (රු. 1,874,991.00) මුදල මත සෑම මසකට වරක් වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) ඉහළින් වාර්ෂිකව 0.5%ට වටයනු ලබන්නාවූ වාර්ෂිකව සියයට හතයි දශම පහක් (7.5%) වූ අනුපාතිකය මත ගණනය කරනු ලබන වැඩිදුර පොලිය ද සහ රුපියල් හත් ලක්ෂ පනස් අට දහස් දෙසීය හැට හයයි ශත අසූ හතක (රු. 758,266.87) මුදල මත වාර්ෂිකව සියයට විසි අටක් (28%) බැගින් වූ අනුපාතිකය මත පොලිය ද හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරිවී ඇති යම් කොටසක් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියේ නියමයන් යටතේ ඉහත කී උකස් බැඳුම්කරවල ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී

විසින් වැයකර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අයකිරීම් ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී දිසානායක මුදියන්සේලාගේ පියතිස්ස දිසානායක යන අය විසින් ඉහත කී අංක 5493, 5408 හා 5915 දරන උකස් බැඳුම්කරයන් මගින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේද, අයි. ඩබ්ලිව්. ජයසූරිය මහනුවර, බලයලත් වෙන්දේසිකරු ලවා විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

### අංක 5493 හා 5915 දරන උකස් බැඳුම්කරයන් මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල නගර සභා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බදුල්ල මහ නගර සභා බලසීමාව ඇතුළත බදුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ රිවර් සයිඩ් පාරේ පිහිටි "කොඩිතුවක්කු කුඹුර" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එෆ්. ඉස්මයිල් විසින් මැන සකස් කරන ලද 1989.03.19 දිනැති අංක 3242 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : නැසීගිය සොයිසාගේ උරුමකරුවන්ගේ වත්ත ද, නැගෙනහිරට : රිවර්සයිඩ් පාර ද, දකුණට : එකී පිඹුරේ ලොට් 2 ද සහ බස්නාහිරට : මුතියංගන විහාරයේ කුඹුර ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ඇතුලු අනෙකුත් සියලු දේ ද සමග වේ. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත. බලයලත් මිනින්දෝරු එම්. බී. එම්. ඒ. බී. ගවරම්මාන විසින් මැතක දී සාදන ලද 2015.01.31 දිනැති අංක 206 දරන නැවත මැනීම් පිඹුර අනුව ඉහත ඉඩම පහත පරිදි විස්තර කෙරේ.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල නගර සභා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බදුල්ල මහ නගර සභා බලසීමාව ඇතුළත බදුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ රිවර් සයිඩ් පාරේ පිහිටි "කොඩිතුවක්කු කුඹුර" නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු එම්. එෆ්. ඉස්මයිල් විසින් මැන සකස් කරන ලද 1989.03.19 දිනැති අංක 3242 දරන පිඹුරේ ලොට් 1 වන) බලයලත් මිනින්දෝරු එම්. බී. එම්. ඒ. බී. ගවරම්මාන විසින් මැන සාදන ලද 2015.01.31 දිනැති අංක 206 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : නැසීගිය සොයිසාගේ උරුමකරුවන්ගේ වත්ත ද, නැගෙනහිරට : රිවර්සයිඩ් පාර ද, දකුණට : බලයලත් මිනින්දෝරු එම්. එෆ්. ඉස්මයිල් විසින් මැන සකස් කරන ලද 1989.03.19 දිනැති අංක 3242 දරන පිඹුරේ ලොට් 2 ද සහ බස්නාහිරට : මුතියංගන විහාරයේ කුඹුර ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම සහ එහි පිහිටි රිවර්සයිඩ් පාරේ වරිපනම් අංක 9 ( දැන් 31-ඊ) දරන ගොඩනැගිලි, ඇතුලු අනෙකුත් සියලු දේ ද සමග වේ.

### අංක 5408 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරලේ දමන්වර ගමේ දමන්වර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වැකඩ පිහිටි "ඇඹිල්ලවෙල්කපල්ලේ පතන, වැවපිටියෙ වත්ත, දුන්කොටුව, උඩහගෙදර වත්ත, ගල්කොටුවෙ වත්ත, නාරංගහවත්ත" යනුවෙන් හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඒ. සමරසේකර විසින් මැන සකස් කරන ලද 2004 නොවැම්බර් මස 07 දිනැති අංක 1446 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ඩී. එම්. කිරිබණ්ඩාගේ වත්ත ද, නැගෙනහිරට : ඩී. එම්. කිරිබණ්ඩාගේ වත්ත ද, දකුණට : දිසානායකගේ වත්ත ද සහ බස්නාහිරට : පාර (ප්‍රධාන පාර) සඳහා වෙන් කිරීම ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තිස් පහයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 35.50) විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද සමග වේ. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

ලක්ෂමන් සිල්වා,  
ප්‍රධාන විධායක නිලධාරි.

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,  
73/5, ගාලු පාර,  
කොළඹ 03.

03 - 110

---

## යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව, යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 ජනවාරි මස 30 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, කොළඹ 13, කේ. සිරිල් සී. පෙරේරා මාවතේ අංක 478/1 දරන ස්ථානයේ සිය ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යනු ලබන, ඩැනියල් ප්ලාස්ටික් ඉන්ඩස්ට්‍රීස් යන නාමය, විලාසය සහ අභිධානය යටතේ තනි අයිතිකරුවකු වශයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන (ලියාපදිංචි අංක W/A 11483 යටතේ බස්නාහිර පළාතේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කරන ලද) ෂන්මුගම් ඩැනියල් සෙල්වම් (ජාතික හැඳුනුම්පත් අංක 701142489V දරන) (මෙහි මින්මතු ඇතැම් තැනක "බන්ධනදායී"

වශයෙන් හඳුන්වනු ලබන) යන අය විසින් 2017 සැප්තැම්බර් මස 20 දින දරන අර්පණ ලිපියේ සඳහන් නියමයන් සහ කොන්දේසි යටතේ රුපියල් හය කෝටියක (රු. 60,000,000.00) කාලීන ණය පහසුකමක් ලබාගෙන, එකී ෂන්මුගම් ඩැනියල් සෙල්වම් යන අය විසින් රුපියල් හය කෝටියක (රු. 60,000,000.00) මුදලක් සඳහා ප්‍රසිද්ධ නොතාරිස් එල්. ජී. එන්. සාරංගි විසින් ලියා සහතික කරන ලද අංක 628 සහ 2017 සැප්තැම්බර් මස 22 දින දරන වල උකස් බැඳුම්කරයක් ලියා අත්සන් කොට තබා, ලියාපදිංචි අංක PB 676 PQ දරන, යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු ඇතැම් තැනක "යූනියන් බැංකුව" වශයෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතු ඉහත කී කාලීන ණය පහසුකම් සහ පොළිය ගෙවීම සඳහා ඇපයක් වශයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඉහත කී වාර ණය පහසුකම නිසා 2018 ජනවාරි මස 17 වැනි දිනට මුළු හිඟ මුදල වන රුපියල් හයකෝටි පහළොස්ලක්ෂ විසිහත්දහස් හයසිය විසිඑකකුත් ශත හතළිස් හයක (රු. 61,527,621.46) මුදල සහ මුල් හිඟ මුදල වන රුපියල් පන්කෝටි අනූපන්ලක්ෂ හතළිස්දෙදහස් තුන්සිය අසූනවයකුත් ශත විසිතුනක (රු. 59,542,389.23) මුදල මත 2018 ජනවාරි මස 18 වැනි දින සිට එකී දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 20% බැගින් තවදුරටත් පොළිය ද, එකී බන්ධනදායිගෙන් යූනියන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද,

ඉහත කී ණය ශේෂය හෝ ඉන් කවර ම වූ කොටසක් එකී බන්ධනදායි විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදු කර ඇති බවට යූනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියා කරමින්, 2018 ජනවාරි මස 17 වැනි දිනට මුළු හිඟ මුදල වන රුපියල් හය කෝටි පහළොස් ලක්ෂ විසිහත් දහස් හයසිය විසි එකකුත් ශත හතළිස් හයක (රු. 61,527,621.46) මුදල සහ මුල් හිඟ මුදල වන රුපියල් පන්කෝටි අනූපන් ලක්ෂ හතළිස් දෙදහස් තුන්සිය අසූ නවයකුත් ශත විසිතුනක (රු. 59,542,389.23) මුදල මත 2018 ජනවාරි මස 18 වැනි දින සිට එකී දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 20% බැගින් තවදුරටත් පොළිය ද, තව ද, ඉහත කී අංක 628 දරන උකස් බැඳුම්කරය සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියළු ම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා එකී අංක 628 දරන උකස් බැඳුම්කරයේ බලය ප්‍රකාරව සහ ඊට යටත්ව යූනියන් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ ඉහත කී 1990 අංක 4 දරන පතන ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, පානම් පත්තුවේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඌරනි ග්‍රාමනිලධාරි වසමේ, ඌරනි හි පිහිටි, ඇරගන් එස්ටේට් හෙවත් උරනික්කාඩු නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ.ඊ.කේ. තිසවීරසිංහ විසින් මැන සාදන ලද අංක 1171/2014 සහ 2014 දෙසැම්බර් මස 28 දින දරන මානක පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 1 දරන බිම් කොටසට මායිම්, ඊසානට : රජයේ සහ තවත් අයගේ ඉඩම ද, ගිණිකොනට : වෙරළ සඳහා වෙන් කළ බිම් කොටස ද, නිරිතට : අංක 202 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 ද, වයඹට : වර්තමානයේ පටුමගක් වන, අංක 202 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 3 ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1171/2014 දරන මානක පිඹුර අනුව අක්කර දහසයකුත් රූඩ් දෙකයි පර්චස් පහක් (අ. 16, රූ. 2, පර්. 5) විශාල බිම් කොටස, ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පලතුරු ආදී සෑම සියලු දේත් සමග ය. මෙම දේපල අම්පාර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ J 08/22 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ඉනෝකා ජයවර්ධන,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

03 - 111

---

### සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

## 2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

බී. එන්. ඩී. දර්ශණ.
ගිණුම් අංක : 0024 5900 0308 සහ 1024 5600 0448.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2017.11.30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. නාගොඩවිතාන යන අය විසින් ලියා සහතික කරන ලද 2015 නොවැම්බර් මස 20 දාතම හා අංක 2505 දරන සහ 2016 මැයි මස 31 දාතම හා අංක 2928 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී

ජනරජයේ බටගොඩ නායකලාගේ දිලීප දර්ශණ යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද එකී අංක. 2505 සහ 2928 දරන බැඳුම්කර ප්‍රකාර අයවියයුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් දෙකෝටි හතලිස් තුන් ලක්ෂ තිස් හය දහස් දෙසිය පහයි ශත අසූවක (රු. 24,336,205.80) මුදලක් 2017 ඔක්තෝබර් මස 31 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් දෙකෝටි හතලිස් තුන් ලක්ෂ තිස් හය දහස් දෙසිය පහයි ශත අසූවක (රු. 24,336,205.80) මුදල ද, 2017 නොවැම්බර් මස 01 වැනි දින සිට අංක 2505 සහ 2928 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැට අට ලක්ෂ හය දහස් තුන්සිය අසූ අටයි ශත අනූ අටක (රු. 6,806,388.98) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයයි දශම දෙකයි පහක් (10.25%) හා තවත් රුපියල් එක් කෝටි හැට පන් ලක්ෂ විසි දහස් නමසිය හතලිස් අටයි ශත හැත්තෑ දෙකක (රු. 16,520,948.72) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයයි දශම හතයි පහක් (10.75%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබීඇති යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක. 2505 සහ 2928 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛණයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි.ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

1. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ දකුණු පිටිගල් කෝරලේ යටකලන් පත්තුවේ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ මහවැව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ පහළ කුඩාවැව අංක 522B දරන ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ කුඩාවැව ග්‍රාමයේ පිහිටි "කොහොඹගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. එෆ්. එච්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2015 සැප්තැම්බර් 27 දාතම හා අංක 6887 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මහවැව සිට නාත්තන්ඩිය - මාදම්පේ පාර දක්වා පාර (මහ මාර්ගය), නැගෙනහිරට : සරත්චන්ද්‍ර රාජපක්ෂ යන අයගේ ඉඩම, දකුණට : පර්සි වීරකෝන් යන අයගේ ඉඩම සහ බස්නාහිරට : දෙවට පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි අටයි දශම දෙකක් (A:0 R:1 P:28.2) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියළු ෙද් සමග එකී අංක 6887 දරන පිඹුරට අනුවය.

එකී කුඩාවැව ග්‍රාමයේ පිහිටි "කොහොඹගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. එෆ්. එච්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1993 ජූලි 03 දාතම හා අංක 1745 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : මහවැව සිට නාත්තන්ඩිය - මාදම්පේ පාර දක්වා පාර (මහ මාර්ගය), නැගෙනහිරට : සරත්චන්ද්‍ර රාජපක්ෂ යන අයගේ ඉඩම, දකුණට : පර්සි වීරකෝන් යන අයගේ ඉඩම සහ බස්නාහිරට : දෙවට පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි අටයි දශම දෙකක් (A: 0 R: 1 P: 28.2) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියළු ෙද් සමග එකී අංක 1745 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව K 144/118 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

උකස් බැඳුම්කර අංක 2505 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ දූනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, කදිරාන - උතුර ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ කදිරාන ග්‍රාමයේ පිහිටි අලුතපල පාර වරිපනම් අංක 58/45 දරන "අක්කරපනහ" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. පී. ආර්. පතිරාජ යන අය විසින් සාදන ලද 2000 පෙබරවාරි 14 දාතම හා අංක 2432A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 2432 දරන පිඹුරේ ලොට් 42, නැගෙනහිරට : අංක 2432 දරන පිඹුරේ ලොට් 13, දකුණට : අංක 2432 දරන පිඹුරේ ලොට් 47 සහ බස්නාහිරට : මේරි ගුණවර්ධන යන අයගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම හයක් (A: 0 R: 0 P: 20.6) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියළු දේ සමග එකී අංක 2432 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව H 173/35 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

1998 අගෝස්තු මස 15 දාතම හා අංක 3889 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 සහ 1998 අගෝස්තු 20 දාතම හා අංක 2432 දරන පිඹුරේ නිරූපිත ලොට් 13 දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද වෙනත් සම්බන්ධ අයිතීන්ද සමගය.

උකස් බැඳුම්කර අංක 2928 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

එකී ඉඩම පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි : 03 - 139

## පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - වවුනියාව ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුගේ නම : වේලු ධර්මපාලන් සහ ධර්මපාල කල්‍යාණි

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2017 ක්වූ ජූනි මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, ඉහත නම් සඳහන් වේලු ධර්මපාලන් සහ ධර්මපාල කල්‍යාණි විසින් 'බන්ධනදායින්' ලෙස ද ධර්මපාල කල්‍යාණි විසින් 'උකස්කරු' ලෙස ද ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට වවුනියාවේ ප්‍රසිද්ධ නොතාරිස් කේ. තයාපරන් විසින් සහතික කරන ලද වර්ෂ 2017.01.05 වන දිනැති අංක 3754 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 3754 දරන උකස්කරය මත, වර්ෂ 2017.06.11 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් අයවිය යුතු රුපියල් හැට දෙලක්ෂ හැට තුන් දහස් තිස් හයයි ශත දෙක (රු. 6,263,036.02) මුදලක් ද, වර්ෂ 2017.06.12 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් පනස් නව ලක්ෂ තිස් පන් දහස් හයසිය විසි පහයි ශත අනූ එකක් (රු. 59,35,625.91) දක්වා වූ මුදල මත වර්ෂයකට 19% ක්වූ පොලිය ද, ඉහත කී බන්ධනදායීන්/උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්,

ඉහත කී උකස්කරය මත අයවිය යුතු එකී රුපියල් හැට දෙලක්ෂ හැට තුන් දහස් තිස් හයයි ශත දෙක (රු. 6,263,036.02) ක මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොලිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අය කර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මහනුවර, මාවිල්මඩ, දුටුගැමුණු මාවතේ, අංක 369/1 හි පදිංචි බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

#### උපලේඛනය

උතුරු පළාතේ, වවුනියාව දිස්ත්‍රික්කයේ, වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි වවුනියාව දකුණු දෙමළ කොට්ඨාස ප්‍රාදේශීය සභා සීමාවේ, කුමන්කුලම් ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කුමන්කුලම් නමැති ග්‍රාමයේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.171 ක විශාලත්වයෙන් යුතු වුවද, බලයලත් මිනින්දෝරු කේ. ආරුමුගම් විසින් මෑතකදී සිදුකළ මැනීම ප්‍රකාර සකස් කළ 2016.09.16 දිනැති අංක 2325 ඒ දරන පිඹුරේ ලොට් 1 යනුවෙන් දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි හතයි දශම දෙකයි හත (අ. 0, රූ. 0, පර්. 27.27) විශාලත්වයෙන් යුතු, උතුරින් : පාර ද, නැගෙනහිරින් : පටු පාර ද, දකුණින් : කේ. රත්නසිංහම් සහ අනෙකුත් අය සතු දේපල ද, බස්නාහිරින් : එස්. රාජලක්ෂ්මී සතු දේපළ ද, මායිම් වූ ඉඩම වේ. මෙම ඉඩම වවුනියාව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO A 30/39 හි ලියාපදිංචිව ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

උදිතා කොඩිකාර,
කළමනාකාරිණී - ණය අයකර ගැනීම්.

03 - 152

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ප්‍රධාන කාර්යාලය

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතියයි

බ්ලූ ලෝටස් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2017 සැප්තැම්බර් මස 28 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ලොලුව විසින් 2016 ජූනි මස 14 වැනි දින සහතික කළ අංක 3683 දරන බැඳුම්කරය මගින් බ්ලූ ලෝටස් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හා හිරන්ජන් සිරිමෙවන් අමරතුංග උකස්කරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. විසින් බ්ලූ ලෝටස් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ලබා දුන් ණය මුදල් සඳහා සුරැකුම් වශයෙන් මෙහි

පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති දේපළ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇති හෙයින් ද,

එසේ හෙයින් ඉහත කී හිරන්ජන් සිරිමෙවන් අමරතුංග යන අය බ්ලූ ලෝටස් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ උකස්කරු වශයෙන් එම සමාගමේ පාලනය හා කළමනාකරණය දරන බැවින් ඒ අනුව එකී හිරන්ජන් සිරිමෙවන් අමරතුංග යන අය එකී බ්ලූ ලෝටස් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අත්‍යාව අයිතිකරු හා පාලනය දරන තැනැත්තා වන අතර හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. විසින් බ්ලූ ලෝටස් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට සැපයූ මූල්‍ය පහසුකම්වල නියම අර්ථලාභියා වනුයේ එකී හිරන්ජන් සිරිමෙවන් අමරතුංග යන අය වන හෙයින් ද,

එකී බ්ලූ ලෝටස් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ හිරන්ජන් සිරිමෙවන් අමරතුංග යන අය හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතු මුදල ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද, 2017 මැයි 30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත රුපියල් එක්කෝටි තිස් හයලක්ෂ හැට එක්දහස් නමසිය හැත්තෑ හයයි ශත අසූ නමය (රු. 1,36,61,976.89) ක එකී බැඳුම්කරය යටතේ අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 1,36,61,976.89 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2017 මැයි මස 31 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද සමග ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා එකී අංක 3683 දරන උකස් බැඳුම්කරය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇති දේපළ මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරලේ උඩුගහ පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලොලුවගොඩ ග්‍රාම නිලධාරි වසමේ ලොලුවාගොඩ ගමේ හි පිහිටි සියඹලාගහවත්ත, වැලබොඩවත්ත සහ කැටකැලගහවත්ත, දික්ගලකන්ද, කැන්දලන්ද, දිවුල්ගහවත්ත, දික්ගලකන්දේවත්ත, කම්බිකොටුව, කෝන්ගහවත්ත, අඹගහවත්ත හෙවත් කැටකැලගහවත්ත, ගලබොඩවත්ත, කොළෙන්කුඹුර බිත්තරපැල සහ බිත්තරපැලපිලපැව නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. බෙල්ලන විසින් 2004 ඔක්තෝබර් 20 වන දින සාදන ලද අංක 984/2004 දරන පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ලොට් "ඒ" වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : ලොට් බී වලින් ද, නැගෙනහිරට : බොරළු පාර සහ ලොට් බී ද, දකුණට : බොරළු පාරෙන් ද සහ බස්නාහිරට : දික්ගලකන්ද පාරේ සිට සහ කුලීගොවියාගේ අන්සතු කරන ලද රජයේ ඉඩමෙන් ද මායිම් වූ එකී අංක 984/2004 දරන පිඹුර ප්‍රකාරව අක්කර නමයයි රූඩ් දෙකයි පර්චස් හතයි දශම පහක (අ. 9, රූ. 2, පර්. 7.5) විශාලත්වයෙන් යුක්ත වන මෙය අත්තනගල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු එෆ් 292/154 යටතේ ලියාපදිංචි වී ඇත.

මණ්ඩලයේ අණපරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

03 - 156/1

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - බොරැල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතියයි

සකිත විජේදාස බටංගල.

2017 ක්වූ අගෝස්තු මස 03 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ෆායිස් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2014 ජනවාරි මස 02 වැනි දින සහතික කළ අංක 2099 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සකිත විජේදාස බටංගල යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑ ලක්ෂ අටදහස් අටසිය විසි දෙකයි ශත විස්සක (රු. 70,08,822.20) මුදලක් 2017 ජූලි 03 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රුපියල් හැත්තෑ ලක්ෂ අටදහස් අටසිය විසි දෙකයි ශත විස්සක (රු. 70,08,822.20) මුදල අයකර ගැනීම සඳහා සහ 2017 ජූලි මස 04 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 2099 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට අත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු ඩැලස් කෙලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෙජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාව තුළ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 477, තලංගම උතුර ඒ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තලංගම උතුර හි පිහිටි වරිපනම් අංක 587/5 පී දරන දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් 2004 මැයි 21 වැනි දින පිළයෙල කරන ලද අංක 2145 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 14 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 2124 දරන පිඹුරේ ලොට් බී සහ ලොට් 13 න් ද, නැගෙනහිරට : ලොට් 21 සහ අංක 2124 දරන පිඹුරේ ලොට් බී වලින් ද, දකුණට : ලොට් 21, 15 සහ 12 න් ද සහ බස්නාහිරට : ලොට් 12 සහ 13 න්ද මායිම් වූ එකී අංක 2145 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වන මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ පත්ඉරු ජී 1472/265 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 2099 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ වඩාත් සවිස්තරව විස්තර කොට ඇති මාර්ග ප්‍රවේශ අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

03 - 156/2

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කිරිබත්ගොඩ ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතියයි

පොන්නම්පෙරුමගේ දොන් ආනන්ද සරත්.
පොන්නම්පෙරුමගේ දොන් මලින්ද තරුෂ අසංක.

2017 ඔක්තොබර් මස 26 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දා වූද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියාන ලද්දාවූද 2014 පෙබරවාරි මස 24 වැනි දින සහතික කළ අංක 4932 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පොන්නම්පෙරුමගේ දොන් ආනන්ද සරත් සහ පොන්නම්පෙරුමගේ දොන් මලින්ද තරුෂ අසංක ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස් දෙලක්ෂ අනූපන් දහස් හත්සිය අසූහතයි ශත හත (රු. 52,95,787.07)ක මුදලක් 2017 සැප්තැම්බර් 20 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රුපියල් පනස් දෙලක්ෂ අනූපන් දහස් හත්සිය අසූහතයි ශත හතක (රු. 52,95,787.07) මුදල අයකර ගැනීම සඳහා සහ 2017 සැප්තැම්බර් 21 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 4932 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට අත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ රාගම් පත්තුවේ වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මගුල්පොකුණ 182ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වැලිසර හි පිහිටි මගුල්පොකුණ පාරේ වරිපනම් අංක 67/8 දරන මගුල්පොකුණ නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ජී. ගුණතිලක විසින් 2004 පෙබරවාරි 25 වැනි දින පිළියෙල කරන ලද අංක 2950 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 6ඒ වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : කලින් රජයට අයිති ජනපද ඉඩමෙන් ද, නැගෙනහිරට : ලොට් 7 න් ද, දකුණට : ලොට් 30 (අඩි 20ක් පළල පාර) න්ද සහ බස්නාහිරට : ලොට් 6 හි ඉතිරි කොටසෙන් ද මායිම් වූ එකී අංක 2950 දරන පිඹුර ප්‍රකාරව පර්චස් පහළොවක (අ. 0, රූ. 0, පර්. 15) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළුම දේත් සමග වන මෙය ගම්පහ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු බී 550/202 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. ඕ. පී. විජේසිංහ විසින් 1974 පෙබරවාරි මස 13 වැනි දින පිළියෙල කරන ලද (පාරක් සඳහා වෙන් කරන ලද) අංක 707 දරන පිඹුරේ ලොට් 30 ලෙස දක්වා ඇති පාරක් සඳහා වෙන්කරන ලද මාර්ගය මතින් ප්‍රවේශ අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

03 - 156/3

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම.

2017.12.21 දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. කේ. එස්. එම්. රත්නායක විසින් සහතික කරන ලද 2012.11.20 දිනැති අංක 2515 දරන උකස් බැඳුම්කරය අනුව 2017.10.19 දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් එක්කෝටි හතලිස්අට ලක්ෂ විසිනව දහස් තුන්සිය අසූහතයි ශත දහයක (රු. 14,829,387.10) මුදල සමග රුපියල් එක්කෝටියක (රු. 10,000,000.00) ණය මුදලෙන් හිඟහිටි මුල් මුදල මත වසරකට සියයට එකළොහයි දශම අටයි දෙක (11.82%) බැගින් 2017.10.20 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පොලියද, අඹන්පොල, දැතව, අනුරාධපුර පාරේ, සී/ස මැග්මා ෆාර්මිස් (පුද්ගලික) සමාගම වෙතින් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එම්.කේ.එස්.එම්. රත්නායක විසින් සහතික කරන ලද 2012.11.20 දිනැති අංක 2515 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් එක්කෝටි හතලිස්අට ලක්ෂ විසිනව දහස් තුන්සිය අසූහතයි ශත දහයක (රු. 14,829,387.10) මුදල සමග 2017.10.20 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාරේ, අංක 24 හි කීර්තිමත් වරලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගමට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, ගල්ගමුව ශාඛාවේ ශාඛා කළමනාකරුහට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වන්නිහත්පත්තුවේ, හතලිස්පහ නැගෙනහිර කෝරළේ, ගල්ගමුව ප්‍රාදේශීය සභා සීමාවේ ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 129 දරන ඊරියාව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඊරියාව පිහිටි ගනේයාය නමැති ඉඩම බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක විසින් සාදන ලද 2011.08.15 දිනැති 18678/2011 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල. උතුරට : ආර්. එම්. මුදියන්සේ උරුමකම් කියන ඉඩම ද, නැගෙනහිරට : ගම්සහා පාර ද, දකුණට : අතරගල්ල වැවද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක විසින් සාදන ලද අංක 4850/99 දරන පිඹුරෙහි ලොට් අංක 1 උළපනේ සීමාව ද මායිම්ව අක්කර පහක (අ.5, රූ.0, පර්.0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සියළු දේ ද වේ. මෙය නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ J 01/244 හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් උපලේඛනය නිවැරදිය.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

ඩබ්. එම්. ආර්. වීරසිංහ මයා,
කළමනාකරු.

ලංකා බැංකුව,
ගල්ගමුව.

03 - 184

---

## ශ්‍රී ලංකා රාජ්‍ය ඡායාරූප උළෙල - 2018

අරමුණ

රාජ්‍ය මැදිහත්වීම තුළ උසස් ප්‍රමිතියකින් යුතු නිර්මාණශීලී ඡායාරූප කලාවක් බිහිකිරීම සහ ප්‍රබුද්ධ ඡායාරූප රසඥතාවක් ඇති කිරීමට දායක වීම.

**තරග අංශ**

**01 වාර්ෂික තේමාගත අංශය - මිනිස් ක්‍රියාකාරකම්හි පාරිසරික බලපෑම්**

පරිසරය කෙරෙහි අසංවේදීව සිදුකෙරෙන විවිධ මිනිස් ක්‍රියාකාරකම් නිසා පරිසර පද්ධතීන්ට සිදුවන බලපෑම් සමස්ත ලෝකයටම අහිතකර ප්‍රතිඵල අත්කරදෙන බව නොරහසකි. එබඳු ක්‍රියාකාරකම් නිසා පරිසරයට සිදුවන්නා වූ විපර්යාසයන් හා ජෛව විවිධත්වය කෙරෙහි සෘජු හෝ වක්‍රව ඇතිවන්නා වූ බලපෑම් විදහා දක්වෙන ඡායාරූප මෙම අංශයට ඇතුළත් වේ.

**02 ජීවන රටා සහ සංස්කෘතිකාංග**

ජීවිතයේ එදිනෙදා සිදුවීම් ඇතුළත් ඡායාරූප, වීදි ඡායාරූප, ආගමික ඇදහිලි, විශ්වාස, උත්සව සහ විවාහ මංගල අවස්ථා ඇතුළු සියලුම ආකාරයේ සංස්කෘතික ක්‍රියාකාරකම් පිළිබිඹු වන ඡායාරූප මේ අංශයට අයත් වේ.

**03 සොබාදහම, වනජීවී හා භූ දර්ශන**

වනජීවීන්ගේ විවිධ චර්යා රටා ඇතුළත් ඡායාරූප, වනජීවී ආලේඛ්‍ය ඡායාරූප, ක්ෂුද්‍ර සහ සූක්ෂ්ම ඡායාරූප, දිලීර රටාවන්, භූ දර්ශන ඇතුළු සොබාදහමෙහි විචිත්‍රවත් බව විදහා දක්වන ඕනෑම ඡායාරූපයක් මෙම අංශයට අයත් වේ.

**04 ජනමාධ්‍ය, ප්‍රවෘත්ති හා ක්‍රීඩා**

ප්‍රසිද්ධ ජනමාධ්‍යයන්හි පළවූ හෝ නොවූ, ප්‍රවෘත්තිමය වටිනාකමකින් යුක්ත ඕනෑම අවස්ථාවක ප්‍රස්තුත විෂය ක්ෂණිකව ග්‍රහණය කරගන්නා ලද ඡායාරූප සහ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම ඡායාරූපයක් මෙම අංශය සඳහා ඉදිරිපත් කළ හැක. 2017-2018 දෙවසර තුළ ගන්නා ලද ඡායාරූප පමණක් මෙම අංශය සඳහා වලංගු වේ.

**05 විවෘත අංශය**

ඕනෑම තේමාවක් යටතට ගතහැකි, සංස්කරණය කළ හෝ නොකළ නිර්මාණාත්මක ඡායාරූප මේ අංශයට අදාළ වේ. අමූර්ත (Abstract), අධිසත්තාවාදී (Surrealist), නිශ්චල ජීවන (Still Life), රාත්‍රී (Night Photography), විලාසිතා (Fashion & Beauty), වෙළෙඳ ප්‍රචාරණ (Commercial), වාස්තු විද්‍යාත්මක (Architectural), පුද්ගල ආලේඛ්‍ය (Portraits), සංචරණ (Travel) හෝ වෙනත් ඕනෑම වර්ගයක ඡායාරූපයක් මෙම අංශයට ඉදිරිපත් කළ හැක.

**තරග කොන්දේසි සහ උපදෙස්**

I තරගය සඳහා අවශ්‍ය අයදුම්පත ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකින් හෝ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැක. නැතහොත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ WWW.culturaldept.gov.lk වෙබ් අඩවියෙන් බාගත (download) කළ හැක.

II රාජ්‍ය ඡායාරූප තරගයට ඇතුළත් වීම සඳහා කිසිදු අයකිරීමක් නොකරන අතර කෘතීන් භාරගන්නා අවසාන දිනය **2018 මැයි මස 15** වැනි දින වේ. මෙදිනට පෙර ඔබගේ සියලු කෘතීන් සහ සම්පූර්ණ කරන ලද අයදුම්පත ආසන්නතම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරි වෙත ලැබෙන්නට සලස්වන්න. එසේ නැතහොත් අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට පැමිණ හෝ ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ හැක.

III රාජ්‍ය ඡායාරූප උළෙලට සම්බන්ධ පිරිස් සහ එම පවුල්වල සාමාජිකයින්ට මේ තරගය සඳහා සහභාගි විය නොහැක.

IV තරගකරුවන්ට ඉහත තරග අංශ අතරින් ඕනෑම අංශ ගණනකට කෘතින් ඉදිරිපත් කළ හැක. **එක් අයෙකුට එක් තරග අංශයක් සඳහා ඉදිරිපත් කළ හැකි උපරිම කෘතීන් සංඛ්‍යාව 04කි.**

V ඉදිරිපත් කරනු ලබන ඡායාරූප වර්ණ හෝ ඒකවර්ණ විය හැකිය. ඒවායේ **දිග පැත්ත අඟල් 15කට නොඅඩු විය යුතු අතර, අඟල් 18 නොඉක්මවිය යුතුය.** ඡායාරූපය පිටුපස ඉහළ වම් කෙළවරේ අයදුම්කරුගේ නම, ලිපිනය, තරග අංශය සහ කෘතියේ මාතෘකාව පැහැදිලිව සඳහන් කළ යුතු ය.

තරගය සඳහා ඉදිරිපත් කෙරෙන ඡායාරූපවල මෘදු පිටපත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, ඒවා පහත පරිදි ෆෝල්ඩර (Floders) 2ක බහා සංයුක්ත තැටියකින් (CD) මුද්‍රිත ඡායාරූප සමගම ඉදිරිපත් කළ යුතු ය.

| | | |
|---|---|---|
| ෆෝල්ඩරය 01 | - | කෘතියේ අවසන් සංස්කරණයට අදාළ JPEG පිටපත (කෘතියේ කුඩාම පැත්තේ අවම දිග ප්‍රමාණය 2400p x විය යුතුය) |
| ෆෝල්ඩරය 02 | - | කෘතියේ සංස්කරණය නොකරන ලද JPEG පිටපත/පිටපත් හෝ RAW පිටපත/පිටපත් |

VI ඡායාරූපවලට හානි නොවන පරිදි ඒවා වෙන වෙනම ආවරණය කොට භාරදිය යුතු අතර, ඡායාරූප සහ අයැදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවර "රාජ්‍ය ඡායාරූප උළෙල - 2018" යනුවෙන් සඳහන් කළ යුතු ය.

VII යම් පුද්ගලයෙකු හෝ පිරිසක් පීඩාවට හෝ අපහසුතාවට පත්වන ආකාරයේ කිසිදු ඡායාරූපයක් තරගය සඳහා ඉදිරිපත් කළ නොහැක. එවන් තත්ත්වයක් පිළිබඳ යම් ගැටලුවක් මතුවන්නේ නම් එහි වගකීම ශිල්පියා විසින් භාරගත යුතුය. මංගල අවස්ථා පිළිබිඹු කෙරෙන ඡායාරූපයන්හි මනාල යුවළ ප්‍රධාන වන්නේ නම්, අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවක එම ඡායාරූප ප්‍රදර්ශනයට ඉදිරිපත් කිරීමට ඔවුන්ගේ අනුමැතිය සහිත ලිඛිත අවසරයක් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට ලබාදිය යුතුය. ශිල්පියා ඒ සඳහා අපොහොසත් වේ නම්, එම කෘතිය තරගයෙන් ඉවත් කිරීමට කටයුතු කෙරෙනු ඇත.

VIII තරගය සඳහා ඉදිරිපත් කරනු ලබන ඡායාරූප ආපසු ලබා දීමට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව නිශ්චිත වශයෙන් බැඳී නොසිටින අතර, තැපෑලේ දී හෝ හැසිරවීමේ දී ඡායාරූපවලට සිදුවිය හැකි භෞතික හානි පිළිබඳ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වගකීමකට බැඳී නොසිටී.

IX ඉදිරිපත් කෙරෙන සියලු කෘතීන්හි පූර්ණ හිමිකම ඡායාරූප ශිල්පියා සතුවන අතර, ප්‍රචාරණ සහ ප්‍රවර්ධන කටයුතු උදෙසා ඒවා භාවිත කිරීමේ අයිතිය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතුවේ.

X සියලු අංශවල කෘතීන් තේරීම ජාතික තලයේ ප්‍රවීණ විද්වත් විනිසුරු මඩුල්ලක් මගින් සිදු කෙරෙන අතර, ජයග්‍රාහී නිර්මාණ තෝරා ගැනීම පිළිබඳ ඔවුන්ගේ තීරණය අවසාන තීරණය වේ.

XI ඡායාරූප ඇගයීමේ දී විනිසුරු මඩුල්ල පහත කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ඇත.

* නව්‍යතාව/නැවුම්බව (Originality)
* නිර්මාණාත්මකබව (Creativity)
* ඡායාරූපමය ගුණාත්මකබව (Photographic Quality)

XII තරගය සඳහා ඉදිරිපත්වීම ම සියලු තරග කොන්දේසිවලට එකඟවීමක් සේ සැලකේ.

XIII රාජ්‍ය ඡායාරූප උළෙල සම්බන්ධ සියලුම ප්‍රතිපත්තිමය තීරණ සහ අවසාන වගකීම සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතුවේ.

XIV රාජ්‍ය ඡායාරූප උළෙල 2018 අගෝස්තු මස 19 වැනි දින සහ ප්‍රදර්ශනය 2018 අගෝස්තු 19, 20 හා 21 යන දිනයන්හි කොළඹ දී පැවැත්වේ.

**තරගය සඳහා ඉදිරිපත්වන කෘතීන් ප්‍රතික්ෂේප විය හැකි අවස්ථා -**

(*a*) ඉදිරිපත් කරනු ලබන ඡායාරූප වටා මුද්‍රිත වර්ණ හෝ කළු සුදු බෝඩ් නොතැබිය යුතු අතර, මවුන්ට් කරන ලද හෝ රාමු කරන ලද ඡායාරූප ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(*b*) කෘතියේ අන්තර්ගතයට අදාළ නොවන බාහිර සලකුණු කිසිවක් (නම්, දිය සලකුණු, දින සලකුණු, සටහන් හෝ ලාංඡන ආදී) ඡායාරූපයේ අඩංගු වේ නම් එම කෘතීන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(*c*) **සොබාදහම, වනජීවී සහ භූ දර්ශන හා ජනමාධ්‍ය, ප්‍රවෘත්ති හා ක්‍රීඩා** යන තරග අංශ දෙක සඳහා සංස්කරණය (ඡායාරූපයේ කොටස් ඉවත් කිරීම හෝ එකතු කිරීම ආදී) නොකරන ලද ඡායාරූප ඉදිරිපත් කළ යුතුය.

එසේ වුවද සමස්ත ඡායාරූපයේ වර්ණ නිවරදකරණය (Colour correction), දහනය කිරීම (Burning), මුවා කිරීම (Dodging), තියුණු කිරීම (Sharpening) හා කප්පාදු කිරීම Cropping) අවශ්‍ය වන්නේ නම් පමණක් ඉතා අවම මට්ටමින් සිදු කළ හැකිය.

(*d*) ඉදිරිපත් කරන ඡායාරූප වෙනත් අයෙකු විසින් රූපගත කරනු ලැබූ හෝ අන්තර්ජාලයෙන් හෝ අන්කවර බාහිර මූලාශ්‍රයකින් හෝ ලබා ගත් ඒවා නොවිය යුතුය. මීට පෙර ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමින් කිසිම ජයග්‍රහණයක් (ත්‍යාග හෝ සහතික) හිමි කරගත් ඡායාරූප මේ සඳහා ඉදිරිපත් කළ නොහැකි අතර, යම් හෙයකින් එවැනි ඡායාරූපයක් ඉදිරිපත්කොට ඇති බව

සනාථ වුවහොත් තෝරාගැණීමෙන් පසුව වුවද තරගයෙන් ඉවත් කරනු ලැබේ.

(*e*) ප්‍රමාද වී ලැබෙන සහ තරග කොන්දේසිවලට පටහැනි ඡායාරූප පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඡායාරූප භාරගන්නා අවසාන දිනය 2018 මැයි 15

සෑම අංශයක් සඳහාම ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථාන තෝරා ගනු ලබන අතර ඒ සඳහා ලැබෙන ත්‍යාග පහත සඳහන් වේ.

* **ප්‍රථම ස්ථානය - රන් සම්මානය, සහතික පත්‍රය සහ රු. 30,000.00**
* **දෙවන ස්ථානය - රිදී සම්මානය, සහතික පත්‍රය සහ රු. 20,000.00**
* **තෙවන ස්ථානය - ලෝකඩ සම්මානය, සහතික පත්‍රය සහ රු. 15,000.00**

**මීට අමතරව එක් අංශයකට කුසලතා සහතික 10 බැගින් ද පිරිනමනු ලැබේ.**

මෙම ලේඛනය රාජ්‍ය ඡායාරූප උළෙලෙහි කෘතීන් භාරගැනීම සම්බන්ධ එකම තීරණාත්මක ලියවිල්ල වන අතර, උපලේඛනගත ඉල්ලුම්පත්‍රය ද මෙම ලේඛනයේ කොටසක් වශයෙන් සැලකිය යුතුය. රාජ්‍ය ඡායාරූප උළෙල සම්බන්ධ වෙනත් පැහැදිලි කිරීම් අවශ්‍ය වෙතොත් ඉදිරියේදී ඡායාරූප ප්‍රවර්ධන අංශය මගින් ලිඛිතව හෝ දුරකථන මාර්ගයෙන් අයැදුම්කරුවන් වෙත දැනුම් දෙනු ඇත. පූර්ව දැනුම් දීමක් සහිතව හෝ රහිතව මෙම ලේඛනය අර්ථ කථනය කිරීමේ, සංශෝධනය කිරීමේ පරිච්ඡින්න කිරීමේ හෝ නව ලේඛනයක් සම්පාදනය කිරීමේ පූර්ණ අයිතිය සහ වගකීම සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතුය.

ශ්‍රී ලාංකික පුරවැසි ශිෂ්‍ය, ආධුනික හෝ වෘත්තීය ඕනෑම ඡායාරූප ශිල්පියෙකුට මෙම තරගය සහ ප්‍රදර්ශනය සඳහා ස්වනිර්මාණ ඉදිරිපත් කරන ලෙස සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ඡායාරූප උපදේශක මණ්ඩලය ආරාධනය කර සිටී.

සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

2018 ජනවාරි මස 25 වැනි දින,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
8 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

විමසීම් .-

රාජ්‍ය ඡායාරූප ප්‍රවර්ධන අංශය.
දුරකථන 0114327597

| කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි | |
|---|---|
| ලි.ප. අංකය | ලැබුණු දිනය |
| කොට්ඨාසය | ඡායාරූප සංඛ්‍යාව |
| භාරගත් අය | |
| අත්සන | |

**ශ්‍රී ලංකා රාජ්‍ය ඡායාරූප උළෙල - 2018**

අයැදුම්පත

අයැදුම්කරුගේ සම්පූර්ණ නම : ..................................................................................................................

අයැදුම්කරුගේ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : ..................................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................... දුරකථන අංකය : ......................................................

ලිපිනය : ..........................................................................................................................................
..........................................................................................................................................

විද්‍යුත් ලිපිනය : ..................................................................................................................

දිස්ත්‍රික්කය : ........................................................... ප්‍රා.ලේ. කොට්ඨාසය : .......................................................

| 01 - වසරේ තේමාව - මිනිස් ක්‍රියාකාරකම්හි පාරිසරික බැලපෑම | |
|---|---|
| අනු අංකය | මාතෘකාව |
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

| 02 - ජීවනරටා සහ සංස්කෘතිකාංග | |
|---|---|
| අනු අංකය | මාතෘකාව |
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

| 03 - සොබාදහම, වනජීවී හා භූ දර්ශන | |
|---|---|
| අනු අංකය | මාතෘකාව |
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

| 04 - ජනමාධ්‍ය, ප්‍රවෘත්ති හා ක්‍රීඩා | |
|---|---|
| අනු අංකය | මාතෘකාව |
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

| 05 - විවෘත අංශය | |
|---|---|
| අනු අංකය | මාතෘකාව |
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

ම විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉදිරිපත් කරන ඡායාරූප කිසිදු ආකාරයකින් ජාතික හෝ ජාත්‍යන්තර තරගවල දී ජයග්‍රහණයන් අත්කරගෙන නොමැති බවත්, තරග කොන්දේසි උල්ලංඝනය වීමක දී තරගයෙන් ඉවත් කිරීම පිළිබඳ විරෝධයක් නොමැති බවත් සහතික කරමි..

........................................................
අත්සන.

දිනය ෑ

03 - 200

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | රු. ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොළොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2018** | | | | | |
| **මාර්තු** | 2018.03.02 | සිකුරාදා | 2018.02.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.09 | සිකුරාදා | 2018.02.23 | සිකුරාද | දහවල් | 12.00 |
| | 2018.03.16 | සිකුරාදා | 2018.03.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.23 | සිකුරාදා | 2018.03.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.29 | බ්‍රහස්පතින්ද | 2018.03.16 | සිකුරාද | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2018.04.06 | සිකුරාදා | 2018.03.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.04.12 | බ්‍රහස්පතින්ද | 2018.03.29 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2018.04.20 | සිකුරාදා | 2018.04.06 | සිකුරාද | දහවල් | 12.00 |
| | 2018.04.27 | සිකුරාදා | 2018.04.12 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **මැයි** | 2018.05.04 | සිකුරාදා | 2018.04.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.05.11 | සිකුරාදා | 2018.04.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.05.18 | සිකුරාදා | 2018.05.02 | සිකුරාද | දහවල් | 12.00 |
| | 2018.05.25 | සිකුරාද | 2018.05.09 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.